## සමාජ ආරක්ෂණ ව්‍යාපෘතිය (SOCIAL PROTECTION PROJECT)

## විධායක සාරාංශය – පාර්ශවකරුවන් ව්‍යාපෘතියට සහභාගි කර ගැනීම පිළිබඳ සැලැස්ම (Stakeholder Engagement Plan)

**ව්‍යාපෘති පසුබිම**

දීර්ඝකාලීන වශයෙන් ශ්‍රී ලංකාවේ පැවති ව්‍යුහාත්මක දුර්වලතා, බාහිරව පැමිණි කම්පනමය සිදුවීම් හේතුවෙන් හා 2019 වසරේ සිදු වූ අකල්බදු කප්පාදුවලින් හෙම්බත් වූ රට දරුණු ආර්ථිකයකට ඇද දැමීම හේතුවෙන් ඒ හරහා දිළිඳු සහ අවදානමට ලක්විය හැකි ජනතාව කෙරේ තවදුරටත් පීඩා ගෙන දෙමින් ඔවුන්ගේ හැකියාවන් දුර්වල කරමින් මානව ප්‍රාග්ධනය පිරිහෙන තත්ත්වයකට ගෙන දීමට හේතු විය. 2018 වසරේ පැවති දේශපාලන අර්බුද, හා අස්ථාවරත්වය මෙන්ම 2019 සිදු වූ පාස්කු බෝම්බ ප්‍රහාරය හා 2020 දී පැමිණි කෝවිඩ් වසංගතය මධ්‍යයේ ආර්ථිකයේ 3.5% ක සංකෝචනයක් සිදු වීම මෙන්ම එම වසරේදිම ණය ශ්‍රේණිගතකිරීම් පහත වැටීම හේතුවෙන් ජාත්‍යන්තර මූල්‍ය වෙළෙඳපොළට පිවිසීමේ හැකියාව අවහිර වීම් හමුවේ ආර්ථික අර්බුදය ඉතා ගැඹුරු මට්ටමකට ඇද වැටීමට ලක් වන විට 2022 අප්‍රෙල් මාසයේදී ශ්‍රී ලංකාව විදේශ ණය ගෙවීම් අත්හිටුවන බව නිල වශයෙන් නිවේදනය කරන ලදී. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජා.මූ.අ) සහාය පතන බව ප්‍රකාශ කිරීමෙන් අනතුරුව ශ්‍රී ලංකා බලධාරීන් හා ජා.මූ.අ. කාර්ය මණ්ඩලය සමඟ 2022 සැප්තැම්බර් මස දී සාකච්ඡා කර ගත් පරිදි නිලධාරි මට්ටමේ ගිවිසුමකට එළැඹී අතර ඒ අනුව මාස 48 විස්තීර්ණ අරමුදල් පහසුකම යටතේ රුපියල් බිලියන 2.9 ක වැඩසටහනක් සඳහා එළැඹිණ. පැවති අර්බුද හමුවේ ඇති නැති පරතරය සීඝ්‍රයෙන් ඉහළ ගිය අතර, 2021 හා 2022 කාලය තුළ දරිද්‍රතා අනුපාතය 13.1% සිට 25.6% දක්වා දෙගුණ වූ අතර, අවදානම් සහිත බොහෝ කණ්ඩායම් දරිද්‍රතා මට්ටමට ඇද වැටීමට ලක්විය.

ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණ ක්‍රමය පුළුල් පරාසයක විහිදී තිබෙන නමුත් එය කැබලි වී ගිය ස්වරූපයක පවතින අතර මුදල් ප්‍රදානයන්, ක්ෂුද්‍ර මූල්‍ය, හා විවිධාකාර ප්‍රජා සහ ජීවනෝපා සංවර්ධන කටයුතුද සපයනු ලබන රජයේ ප්‍රධානතම සමාජ ආධාර ක්‍රමය වන සමෘද්ධි වැඩසටහනද මෙයට ඇතුළත් වේ. මීට අමතරව, අඩු ආදායම්ලාභී වයස අවුරුදු 70 ට වැඩි පුද්ගලයින් (වැඩිහිටි දීමනාව), ආබාධිත පුද්ගලයින් (ආබාධිතයින් සඳහා ලබා දෙන දීමනාව), හා හේතු හඳුනානොගත් නිදන්ගත වකුගඩු රෝගයෙන් පීඩා විඳින පුද්ගලයින්ද (වකුගඩු රෝගීන් සඳහා ලබා දෙන දීමනාව) ඉලක්ක කර ගනිමින් තවත් ප්‍රධාන මූල්‍ය සහන ආධාර වැඩසටහන් කාණ්ඩ 03ක් ක්‍රියාත්මක වේ. මෙම දීමනාවන් ඇතුළත් වැඩසටහන් සඳහා සේවා සැපයීමේදී (එනම් ප්‍රතිලාභීන් තෝරා ගැනීම, ලියාපදිංචිය, ගෙවීම් හා දුක්ගැනිවිලි පිළිබඳ කටයුතු කිරීම) නිසි කළමනාකාරිත්වයකින් හා සම්බන්ධීකරණයකින් තොරව වෙන් වෙන් වශයෙන් ක්‍රියාත්මක වේ. මෙහිදී එකම ක්‍රියාකාරකම නැවත නැවත සිදුවීමෙන් වන ද්විගණනයන්ද සැළකිය යුතු මට්ටමක පවතින බැවින් මෙහෙයුම් වියදම් ඉහළ යාම, අකාර්යක්ෂමතාවය, නිසි ස්වාධීන අධීක්ෂණයකින් තොරව සිදුවන බැවින් වගවීම පිළිබඳව ද ගැටළු පැන නැගේ. 2019 වසරේදී මූල්‍ය සහන ලබන දුප්පත්ම කාණ්ඩවලින් 48%කට පමණක් සමෘද්ධි සහනය ලැබුන අතර එම වසරේදීම ඉහළම ආදායම්ලබන පිරිසගෙන් 12% කටද සමෘද්ධි මූල්‍ය සහන ආධාර ලබාදී තිබිණ (ලෝක බැංකුව 2022).

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ අරමුදල් පහසුකම[1] හා ලෝක බැංකුව ශ්‍රී ලංකාවට ලබාදීමට නියමිත ඔරොත්තුදීමට ඇති හැකියාව, ස්ථාවරත්වය, ආර්ථික පරිවර්තනය, හා සංවර්ධන ප්‍රතිපත්ති මෙහෙයුම්[2] හරහා ආධාර රටේ පවත්නා මුදල් ප්‍රදාන වැඩසටහන්වල තිබෙන ප්‍රතිපත්ති මට්ටමේ සීමාවන් ඉවත් කිරීමට උත්සාහ දරන අතර විනිවිදභාවයෙන් යුතු, මැනවින් ඉලක්ක හඳුනාගත්, වඩාත් ඵලදායී, හා ඔරොත්තුදීමට හැකියාව ඇති නව සමාජ ආරක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීමටද සහාය වේ. සේවා සැපයීම් සඳහා දැනට ක්‍රියාත්මක කරමින්

[1] විස්තීර්ණ අරමුදල් පහසුකම 2023 මාර්තු 21 වන දින අනුමත කරන ලදි.

[2] 2023 ජුනි මාසයේදි ලෝක බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔරොත්තුදිමේ හැකියාවය, ස්ථාවරත්වය,ආර්ථික පරිවර්තනය,හා සංවර්ධන ප්‍රතිපත්ති මෙහෙයුම් අනුමත කිරිමට අපේක්ෂිතය.

තිබෙන ලියාපදිංචි කල සමාජ ලේඛනය[3], ශක්තිමත් සුදුසුකම් නිර්ණායක[4], හා ඉලක්කගත මුදල් ප්‍රදාන වැඩසටහන් සඳහා ඩිජිටල්කරණය කල ගෙවීම්[5] මතද පදනම් වූ නව සමාජ ආරක්ෂණ ක්‍රමයක් ස්ථාපිත කිරීමට ආධාර ලබාදීම, ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණවල ඇතුළත් වේ. මීට අමතරව, සුබසාධන ප්‍රතිලාභ අයදුම්කරුවන්ගේ දත්ත කළමනාකරණය සම්බන්ධීකරණය කිරීමට හා මුදල් ප්‍රදාන සැළසුම් කිරීමට මෙන්ම ක්‍රියාත්මක කිරීමට ද වරමක් සහිතව ස්ථාපිත කර ඇති, 2022 ජූලි මස සිට ක්‍රියාත්මක වන සුබසාධන ප්‍රතිලාභ මණ්ඩලය[6] ඉහත ප්‍රයත්නයන්ට නායකත්වය සපයනු ඇත. නව සමාජ ආරක්ෂණ ව්‍යාපෘතිය, ප්‍රධාන ප්‍රතිසංස්කරණ සඳහා ලෝක බැංකුව විසින් ලබාදීමට නියමිත ඔරොත්තුදීමට ඇති හැකියාව, ස්ථාවරත්වය, ආර්ථික පරිවර්තනය, හා සංවර්ධන ප්‍රතිපත්ති මෙහෙයුම් හරහා සපයන්නා වූ ආධාර සම්පූර්ණ කරයි.

**ව්‍යාපෘතියේ පරමාර්ථ හා සංරචක**

ලෝක බැංකුව විසින් මූල්‍ය ප්‍රතිපාදන සපයන්නා වූ නව සමාජ ආරක්ෂණ ව්‍යාපෘතිය ආර්ථික අර්බුදය නිසා දිළිඳු ජනතාවට සහ වඩාත්ම අවදානමකට ලක්විය හැකි පුද්ගලයින්ට ඇතිවන පීඩාවන් සමනන් කිරීම අරමුණු කර ගත්තකි. මේ යටතේ ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණ ක්‍රමයේ අනුවර්තික හැකියාව සහ සවිමත්බව තවදුරටත් ශක්තිමත් කරන අතරවාරයේදී ඉහතින් දක්වන ලද ජන කොටස්වලට ආදායම් උපකාරක සහ ජීවනෝපාය අවස්ථාවන් සැපයීම අපේක්ෂිතයි. පහත දැක්වෙන පරිදි ව්‍යාපෘතිය සංරචක 03න් සමන්විත වේ.

1. **පළමුවන වන සංරචකය - ආධාර මුදල් ප්‍රදාන ලබාදීම**

අළුතින් ස්ථාපිත කරන ලද සමාජ ලේඛනය භාවිතා කරමින් සහ නව සුබසාධන ප්‍රතිලාභ ගෙවීම් ක්‍රමය මත පදනම්ව ඉලක්කගත දිළිඳු සහ අවදානමකට ලක්විය හැකි ගෘහයන්ට මුදල් ප්‍රදාන ලබාදීම

2. **දෙවන සංරචකය - දිළිඳු සහ අවදානමට ලක්විය හැකි ගෘහයන් සඳහා ආර්ථික අවස්ථාවන් වැඩි කිරීමේ නියමු වැඩසටහන**

මේ යටතේ තෝරාගන්නා ලද භූමි ප්‍රදේශ සහ ආර්ථික අංශයන්හි සිටින දිළිඳු ජනතාව සහ අවදානමට ලක්විය හැකි ජනතාව කුඩා පරිමාණයේ ආර්ථික වැඩසටහන්වලට ඇතුළත් කරනු ඇත.

3. **තෙවන සංරචකය - ව්‍යාපෘති කළමනාකරණය සහ සමාජ ආරක්ෂණ පද්ධති ශක්තිමත් කිරිම**

මේ යටතේ අත්‍යවශ්‍ය පුද්ගලයින්ට මුදල් ප්‍රදාන ලබාදීම සහ ආර්ථික ක්‍රියාකාරිත්වයන් සැපයීම ඵළදායී ලෙස ඉටු කිරීම සඳහා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ආයතනවල කළමනාකරණය සහ වගවීමේ යාන්ත්‍රණයන් වැඩි දියුණු කිරීමට සිදු කරන ක්‍රියාකාරකම් වලට ව්‍යාපෘතිය විසින් මූල්‍යමය ප්‍රතිපාදන ලබාදෙනු ඇත.

**සමස්ත ප්‍රතිලාභීන්**

**ව්‍යාපෘතියේ ඍජු ප්‍රතිලාභී පවුල් ගණන මිලියන 2ක් වන අතර ඉන් ආවරණය වන ප්‍රතිලාභී ජන සංඛ්‍යාව මිලියන 7.4 ක් වේ.** යතාවත් කරන ලද සමාජ ලේඛනය මගින් පවුල් මිලියන 3.55 ක් ආවරණය වේ. ඍජු ප්‍රතිලාභී පවුල් මිලියන 2, ලෝක බැංකු සමාජ ආරක්ෂණ නියමු ව්‍යාපෘතිය යටතේ මුදල් ලැබීම් තුළින් ප්‍රතිලාභ ලබන අතර එයින් ආවරණය නොවන එහෙත් සමාජ ලේඛනයේ ඇතුළත්ව සිටින පවුල්, රජයේ අනාගත වැඩසටහන් සඳහා ඉලක්කගත කිරීම් තුළින් සහ දරිද්‍රතා මට්ටමින් පහතට වැටෙන පවුල් සඳහා මුදල් ආධාර ලැබීම් තුළින් ප්‍රතිලාභ අත්කර ගනු ඇත. දිළිඳු පවුල් සහ අවදානමට ලක් විය හැකි පවුල්, සහ වයස්ගත පුද්ගලයින්, ආබාධිත පුද්ගලයින්, සහ හඳුනා නොගත් වකුගඩු රෝගවලින් පීඩා විඳින රෝගීන් වැනි සුවිශේෂී කණ්ඩායම් ව්‍යාපෘතිය යටතේ මූල්‍යමය ආධාර ලැබීම් තුළින් ප්‍රතිලාභ අත් කර ගනු ඇත. එමෙන්ම, ස්ත්‍රී මූලික ගෘහයන් අවදානමට ලක්වීමේ

[3] සමාජ ලේඛනයේ පවුල් මිලියන 3.7 ක් ලියාපදිංදි වී ඇති අතර ඔවුන්ගේ නිවාසවලදි ප්‍රාදේශිය නිලධාරින් විසින් මුදල් ප්‍රතිලාභ ලැබීමට ඔවුන්ගේ ඇති සුදුසුකම් පරික්ෂාකර නිර්ණය කිරිම සඳහා සමික්ෂණ කටයුතු දැනට සිදුකරමින් පවති.
[4] 2023 පෙබරවාරි 9 වන දින පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද "***මුදල් ලැබීම සඳහා සුදුසු පුද්ගලයන් තෝරා ගැනීම්***" ට අදාල විධිවිධානවල මෙය අන්තර්ගත වේ.
[5] ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ වලදි සමෘද්ධි මුදල් ප්‍රතිලාභ ගෙවිම සම්බන්ධ ඔවුන්ගේ කාර්යභාර්ය අවශ්‍යයෙන්ම සමෘද්ධි ආයතනයෙන් ඉවත්කරන අතර ඔවුන් මෙම වැඩසටහනේ ප්‍රතිලාභීන්ට මුදල් නොවන ආධාර උපකාර පිරිනැමීම සම්බන්ධයෙන් තවදුරටත් වගකීම් දරනු ඇත.උදාහරණයක් වශයෙන් ජීවනෝපා/ දිළිඳු පුද්ගලයන් ආර්ථික වැඩසටහන් වලට ඇතුළත් කිරිම සම්බන්ධ සේවා සැපයිම.
[6] 2002 සුබසාධන ප්‍රතිලාභ පනත යටතේ සුබසාධන ප්‍රතිලාභ මණ්ඩලය ස්ථාපිත කරන ලදි.

ඇති ඉහළ නැමියාව හේතුවෙන් මුදල් ආධාර ලබන කණ්ඩායම් අතර 20% ක පමණ ඉහළ අගයක් ගනු ඇති බවට අපේක්ෂිතයි. **ආර්ථික අවස්ථාවලට ඇතුළත් කිරීමේ ක්‍රියාවලිය තුලින් ප්‍රතිලාභීන් 5,800 ක් පමණ දෙනා දෙවන සංරචකය යටතේ ආධාර ලැබීමට අපේක්ෂිතය.** අවදානමට ලක්වීමේ ඇති ඉහළ නැමියාව නිසා කාන්තාවන්, විශේෂයෙන්ම ස්ත්‍රී මූලික ගෘහයන්, මෙම වැඩසටහනෙහි ප්‍රධානතම ඉලක්කගත කණ්ඩායම වේ. මෙම සංරචකය ආබාධිත පුද්ගලයින් සඳහා සුදුසු වැඩසටහන් නියමු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහාද උපකාර කරනු ඇත.

## ආයතනික ක්‍රියාපටිපාටි

මෙම ව්‍යාපෘතිය, මුදල්, ආර්ථික ස්ථායිකරණය සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය හා කාන්තා, ළමා කටයුතු සහ සමාජ බලගැන්වීමේ අමාත්‍යාංශය යන ආයතන දෙක මගින් ක්‍රියාත්මක කරනු ලබයි. මුදල් අමාත්‍යාංශය, සහ කාන්තා ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශය යටතේ තිබෙන සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් හඳුනා ගනු ලබන ව්‍යාපෘති කළමනාකරණ කණ්ඩායම් ලෝක බැංකුවේ ස්ථාපනය කරනු ඇත. ලෝකබැංකුවේ පිහිටුවන ලබන මුදල් අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යාපෘති කළමනාකරණ කණ්ඩායම පලමුවන සංරචකය එනම් මූල්‍ය ප්‍රතිපාදන ලබා දීම, පිළිබඳ එදිනෙදා මෙහෙයුම් කලමනාකරණය කරනු ඇත. කාන්තා සහ ළමා කටයුතු සහ සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශය යටතේ ඇති සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ලෝකබැංකුවේ පිහිටුවන ලබන ව්‍යාපෘති කළමනාකරණ කණ්ඩායම දෙවන සංරචකය එනම්, ආදායම් උත්පාදන වැඩසටහන් සඳහා ඇතුළත් කිරීමේ එදිනෙදා මෙහෙයුම් කළමනාකරණය කරනු ඇත. සංරචක 3 යටතේ වන 3.1 උප සංරචකය මුදල් අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන අතර උප සංරචක 3.2 කාන්තා ළමා කටයුතු සහ සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ඇත.

## පාරිසරික සහ සමාජමය අවදානම්

ව්‍යාපෘතියේ පාරිසරික අවදානම අඩු බවට හඳුනාගෙන් ඇත. එසේ වුවත්, සමාජමය වශයෙන් ඇති අවදානම් සැළකිය යුතු මට්ටමක ඇති බව තක්සේරු කර ඇත. ප්‍රධාන සමාජමය අවදානම් විභවතාවන් අතර පහත සඳහන් කරුණු අන්තර්ගත වේ.

අ. ඉලක්කගත කිරීමේ වැරදි, ඉදිරිපත් කරනු ලැබූ දත්තවල ඇති දෝෂ, සත්‍යාපනයට හසු නොවූ දෝෂ, අවදානමට ලක්විය හැකි කණ්ඩායම් මුහුණ දෙන ගැටළු, උදා., තොරතුරු සඳහා ප්‍රවිශ්ය වීමට ඇති ගැටළු හා තොරතුරු බාරදීමේ ගැටළු, බැංකු ගිණුම් විවෘත කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී සහ මුදල් ආපසු ලබා ගැනීමේදී ද ඇති වන ගැටළු

ආ. ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන් නොවන අය සහ ව්‍යාපෘතිය ගැන උනන්දුවක් දක්වන වෙනත් කණ්ඩායම් විසින් අනවබෝධය නිසා සහ ව්‍යාපෘති ක්‍රියාවලීන්, දත්ත ආරක්ෂණය, උපදේශනය, අභියාචනා සහ දුක්ගැනවිලිවලට ප්‍රතිචාර දැක්වීම සඳහා තිබෙන යාන්ත්‍රණයන් ආදි ඇති විනිවිදභාවයක් නොමැති කම හේතුවෙන් කරනු ලබන නොසන්සුන්තාවයන්, සහ තම බලාධිකාරය සහ බලපෑම් කිරීමට ඇති හැකියාව නැතිවීමට ඉඩ තිබෙන නිසා ප්‍රාදේශීය මට්ටමෙමේ නිලධාරීන් විසින් දක්වන විරෝධතාවයන්

ඇ. ව්‍යාපෘති කළමනාකරණ කණ්ඩායම්තුළ සමාජමය අවදානම් සමහන් කිරීමට, විශේෂයෙන්ම පාර්ශවකරුවන් සහ පුරවැසියන් සහභාගිකර ගැනීමේ ක්‍රියාවලියට හා අභියාචනා සහ දුක්ගැනවිලිවලට ප්‍රතිචාර දැක්වීමට, ඇති සීමිත හැකියාව

මෙම අවදානම් අවම කිරීම සඳහා ව්‍යාපෘතිය විසින් අළුතින් ස්ථාපනය කරන ලද සමාජ ලේඛනයේ ඇති, එමෙන්ම අනන්‍යතාවය සහ යෝග්‍යතාවය විනිවිදභාවයකින් යුතුව සත්‍යාපනය කරන ලද පුද්ගලයින්ට පමණක් මුදල් ආධාර ලබා දෙනු ඇත. මීට අමතරව, වගවීම මැනවින් සිදුකිරීම සඳහා සහ ප්‍රවේශය පහසුකිරීම සහතික කිරීම සඳහා ප්‍රතිලාභ ගෙවීම් විද්‍යුත් ක්‍රමයට ප්‍රතිලාභීන්ගේ පෞද්ගලික බැංකු ගිණුම්වලට බැර කරනු ලැබේ. මීට අමතරව, මුදල් ගෙවීම පිලිබඳව අදාළ සියළුම අංශ ආවරණය වන්නා වූ සන්නිවේදන ව්‍යාපාරයක් දියත් කිරීමට, සහ නිසි ලෙස ක්‍රියාත්මක වන, නිසි කලට දුක්ගැනවිලි සහ අභියාචනාවලට ප්‍රතිචාර දක්වන ක්‍රියාත්මක වන්නා වූ යාන්ත්‍රණයක් ඇති කිරීමට ව්‍යාපෘතිය මූල්‍යමය දායකත්වය සපයනු ඇත. ලිංගික සූරාකෑම් සහ ලිංගික අඩන්තේට්ටම් කිරීමකට කිසිසේත්ම ඉඩ නොතබන ප්‍රතිවිපාකද ඇතුළත්, පැහැදිලි චර්යාමය ප්‍රමිතීන් අනුගමනය කරනු ලබන අතර එය සියළුම ව්‍යාපෘති ක්‍රියාකාරීන්ට සන්නිවේදනය කරනු ඇත. සුදුසුකම්ලත් සේවා

සපයන්නන් හරහා රහසිගතව මෙවැනි සිද්ධීන් වාර්තා කිරීමට සහ ප්‍රතිචාර දැක්වීමට යාන්ත්‍රණයක් ඇති කරනු ඇත.

## පාර්ශවකරුවන් නිරන්තරව සම්බන්ධ කර ගැනීම පිළිබඳ ලෝක බැංකු අවශ්‍යතාවයන්

සමාජ ආරක්ෂණ ව්‍යාපෘතිය පිළියෙල කිරීමේදී එය "පාර්ශවකරුවන්ගේ සහභාගිත්වය සහ තොරතුරු හෙළිදරව් කිරීම පිළිබඳ පාරිසරික හා සාමාජීය ප්‍රමිති අංක 10"ට අනුකූලව සිදු කරන ලදී. පාර්ශවකරුවන් සහභාගි කර ගැනීමේ සැළසුමෙහි (Stakeholder Engagement Plan) සමස්ත පරමාර්ථය වන්නේ පාර්ශවකරුවන් සහභාගි කර ගැනීම සඳහා ක්‍රමානුකූල ප්‍රවේශයක් ස්ථාපනය කිරීම, ඔවුන් සමඟ නිර්මාණශීලි සබඳතාවයන් පවත්වා ගැනීම, පාර්ශවකරුවන්ගේ අදහස් සැලකිල්ලට ගැනීම, සහ ව්‍යාපෘතියෙන් බලපෑම් ලබන සියලු කණ්ඩායම් ඵලදායීව සහභාගිකර ගැනීමට හැකි මාර්ග ප්‍රවර්ධනය කිරීම සහ සපයා දීමයි. මහජනයා වෙත තොරතුරු හෙළිදරව් කිරීම සහ ඔවුන් සමඟ උපදේශනයන්හි නිරත වීමද මෙයට ඇතුළත් වේ.

ව්‍යාපෘති කළමනාකරණ කණ්ඩායම් පාර්ශවකරුවන් සමඟ සන්නිවේදනය කරනු ඇති ආකායරන් පාර්ශවකරුවන් සහභාගි කර ගැනීමේ සැළසුම ඉදිරිපත් කරන අතර එයට මහජනයාට සිය ගැටළු මතු කිරීමට, ප්‍රතිපෝෂණ ලබා දීමට හෝ පැමිණිලි කිරීමට හැකි, එමෙන්ම සමස්ත ව්‍යාපෘතිය සම්බන්ධයෙන් හෝ ව්‍යාපෘතියට අදාළ ඕනෑම ක්‍රියාකාරකමක් සම්බන්ධයෙන් විරෝධතා පැමිණිළි කිරීමට හැකි යාන්ත්‍රණයක් ද ඇතුළත් වේ. සිදු කරන ලද උපදේශනයන්හි සාරාංශයක්ද පාර්ශවකරුවන් සහභාගි කර ගැනීමේ සැළසුමට අන්තර්ගතකර ඇත. පාර්ශවකරුවන් සහභාගි කර ගැනීමේ සැළසුම අමාත්‍යාංශ වෙබ් අඩවිවල මහජන සමාලෝචන සහ අදහස් ඉදිරිපත් කිරීම සඳහා ප්‍රසිද්ධ කර ඇත. මෙම සැළසුම ව්‍යාපෘති ජීවන චක්‍රය පුරා වරින් වර යාවත්කාලීන කරන්නා වූ සජීවි ලියවිල්ලකි. වැදගත් වෙනස්කම් සැළසුමට සිදු කරන්නේ නම් ණය ගැණුම්කරුවා විසින් එසේ යාවත්කාලීන කළ සැළසුම් ප්‍රසිද්ධ කළ යුතු වේ.

## සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතියේ අත්දැකීම් (Social Safety Nets Project) හා ව්‍යාපෘතිය සකස් කිරීම සඳහා සිදුකළ උපදේශනයන්

සමාජ ලේඛන තොරතුරු පද්ධතියක් සකස් කිරීම සඳහා සුබසාධන ප්‍රතිලාභ මණ්ඩලයක් පිහිටුවීම වෙනුවෙන් ලෝක බැංකුව විසින් සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය යටතේ මූල්‍යාධාර ලබා දුන් අතර එම ව්‍යාපෘතිය පදනම් කර ගෙන මෙම නව සමාජ ආරක්ෂණ ව්‍යාපෘතිය සකස් කර ඇත. සුබසාධන ප්‍රතිලාභ මණ්ඩලය විසින් නව සමාජ ලේඛන තොරතුරු පද්ධතිය පාලනය කිරීම සහ නඩත්තු කිරීම සහ ප්‍රතිලාභීන් තෝරා ගැනීම සිදු කරනු ඇත. සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය යටතේ සන්නිවේදන උපාය මාර්ගයක් සහ දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණයක් සංවර්ධනය කරන ලදී. මෙම යාන්ත්‍රණය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක නොවුවද එය දැනට සංවර්ධනය කරමින් පවත්නා ඒකාබද්ධ සුබසාධන කළමනාකරණ පද්ධතිය සමඟ සම්බන්ධ කරනු ඇත. දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණය දැනට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් මඟින් සුපුරුදු ලෙස අතින් ලේඛනගත කිරීමේ ක්‍රමයට ක්‍රියාත්මක වේ.

සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය යටතේ පුරවැසි සහභාගිත්ව ක්‍රියාකාරකම් සහ පාර්ශ්වකරුවන් සමඟ සිදු කරන උපදේශනයන්, ලෝක බැංකු ආධාර ලැබීමට නියමිත වැඩිදියුණු කරන ලද ඒකාබද්ධ සමාජ ආරක්ෂණ පද්ධතියේ සමස්ත සැලසුම සැකසීම සඳහා යෙදවුමක් විය. ඊට අමතරව, ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ව්‍යාපෘතියේ බලපෑමට ලක් වන පුද්ගලයින් සහ ව්‍යාපෘතිය පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශ්ව සමඟ පවත්වන ලද උපදේශනයෙන් නව සමාජ ආරක්ෂණ ව්‍යාපෘතිය පිළියෙල කරන අතරවාරයේ සිදු කරන ලදී. මෙම උපදේශනයන්ගෙන් සොයා ගත් කරුණු කාරණා මහජනයා සඳහා ප්‍රසිද්ධ කරනු ලැබ ඇති ව්‍යාපෘතියේ පාර්ශවකරුවන් සම්බන්ධ කර ගැනීමේ සැලසුමෙහි අන්තර්ගත වේ.

## පාර්ශවකරුවන් හඳුනා ගැනීම සහ විශ්ලේෂණය

ව්‍යාපෘතිය නිසා සෘජුවම බලපෑමට ලක්වන කණ්ඩායම් හා ආයතන මෙන්ම ව්‍යාපෘති මූල්‍යාධාර සහ ජීවනෝපාය ආධාර සැපයීම සම්බන්ධ ව්‍යාපෘති ක්‍රියාකාරකම්වලට යම්කිසි සම්බන්ධතාවක් තිබීම හේතුවෙන් වෙනස්වීම්වලට භාජනය වීමට හෝ ලක්වීමට වඩාත් ගොදුරු විය හැකි බවට හඳුනාගෙන ඇති කණ්ඩායම්ද ව්‍යාපෘතිය හේතුවෙන්

"බලපෑම් ලබන පාර්ශවයන්" ලෙස ව්‍යාපෘතිය මඟින් හඳුනාගෙන ඇත. දරිද්‍රතා රේඛාවට පහළින් ජීවත් වන දිළිඳු ගෘහයන්ද, ස්ත්‍රී මූලික හෝ තනිවම පවත්වාගෙන යන දිළිඳු ගෘහයන්ද ගැබිනි සහ කිරි දෙන මව්වරුන්ව සිටින දිළිඳු කාන්තාවන්ද, වැඩිහිටි පුද්ගලයින්, ආබාධිත පුද්ගලයින්, හා හඳුනා නොගත් වකුගඩු රෝගය/පිළිකා/බෝනොවන රෝග වලින් පෙලෙන (රාජ්‍ය අනුග්‍රහය මත යැපෙන) පුද්ගලයින්ද, වතු ප්‍රජාවන්ද අඩුපහසුකම් ලබන නාගරික ජනාවාසද දුරස්ථ ග්‍රාමීය ප්‍රදේශවල සිටින ජනයාද සාම්ප්‍රදායික ආම්පන්න භාවිතා කරන දිළිඳු ධීවරයින්ද මුදල් භෝග වවන සුළු පරිමාණ දිළිඳු ගොවීන් ද ස්වාභාවික විපත්වලින් පීඩාවට පත් දිළිඳු ගෘහයන්ද වතුවල ජීවත්වෙන අවිධිමත් කම්කරුවන්ද අපනයන සැකසුම් කලාපවල සිටින සුළු කම්කරුවන්ද (නිල් කරපටි කම්කරුවන්) නාගරිකව සහ ග්‍රාමීය වෙසෙන දුප්පත් කුටුම්භවල රැකියා විරහිත තරුණ - තරුණියන්ද අනියම් කම්කරුවන්ද ක්ෂුද්‍ර/කුඩා/සුළු ව්‍යාපාර හිමියන්ද, ව්‍යාපෘතියෙන් පීඩාවට පත් පාර්ශවයන් අතර අවදානමට ලක්විය හැකි බවට හඳුනා ගත හැකි කණ්ඩායම් කීපයකි. ව්‍යාපෘතිය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ඊට ඇඩි හෝ මධ්‍යම ප්‍රමාණයෙන් උනන්දුවක් දක්වන/බලපෑම් කළ හැකි කණ්ඩායම්ද ව්‍යාපෘතිය විසින් පාර්ශවකරුවන් ලෙස හඳුනාගෙන ඇත. ඇඩි බලපෑමක් කළ හැකි අය අතරට මුදල් අමාත්‍යාංශය, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය, දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන් සහ ක්ෂේත්‍ර නිලධාරින්, සුබසාධන ප්‍රතිලාභ මණ්ඩලය, සමෘද්ධි දෙපාර්තමේන්තුව, ජාතික වැඩිහිටි ලේකම් කාර්යාලය, ආබාධ සහිත පුද්ගලයන් සඳහා වන ජාතික ලේකම් කාර්යාලය ඇතුළත් වේ.

## සන්නිවේදනය සහ තොරතුරු හෙළිදරව් කිරීම

රජයේ සහ ලෝක බැංකුවේ නිල අනුමැතිය ලැබීමෙන් පසු පාර්ශවකරුවන් සහභාගි කරගැනිමේ සැලසුම (Stakeholder Engagement Plan), සහ පාරිසරික හා සමාජමය කැපවීම් සැලැසුම (Environment and Social Commitment Plan) වැනි පාරිසරික සහ සමාජමය ආකෘතීන් මුදල් අමාත්‍යාංශයේ හා කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ වෙබ් අඩවිවලද ලෝක බැංකුවේ බාහිර වෙබ් අඩවියේද ව්‍යාපෘති තක්සේරු අදියරේ දී අනාවරණය කරන ලදී.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කාලය තුළදී ප්‍රධාන පාරිසරික හා සමාජමය ආකෘති වාර්තාවන්ට අමතරව, කාර්තුමය වාර්තා, වාර්ෂික වාර්තා, සහ නියාමන ක්‍රියාකාරකම් වැනි ඒ ඒ උප ව්‍යාපෘතිවලට සුවිශේෂී ආරක්ෂණ මෙවලම්, පාරිසරික හා සමාජමය කැපවීම් සැලසුම සහ පාර්ශවකරුවන්ගේ සහභාගි කරගැනිමේ සැලසුම ප්‍රකාරව මහජනතාවගේ දැන ගැනීම පිණිස හෙළිදරව් කරනු ලැබේ. සියලුම ලේඛනවල විධායක සාරාංශයන් දේශීය භාෂාවලට පරිවර්තනය කර මහජනතාව සඳහා හෙළිදරව් කරනු ඇත. ප්‍රතිලාභීන් ලෙස තෝරා ගැනීම සඳහා සපුරාළිය යුතු සුදුසුකම්, නිර්ණායක, අයදුම් කිරීමේ ක්‍රියා පටිපාටි, ප්‍රතිලාභීන් තෝරා ගැනීම, ප්‍රගති වාර්තාකරණය, උපදේශනය, දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණයන්, ධාරිතා වර්ධන සහ දැනුවත් කිරීමේ වැඩසටහන් වැනි ව්‍යාපෘතියට සම්බන්ධ තොරතුරු විද්‍යුත් වේදිකාවන්, මුදල් අමාත්‍යාංශයේ සහ කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ වෙබ් අඩවිවල, හා රූපවාහිනී, පුවත්පත්, ගුවන්විදුලිය වැනි සම්ප්‍රදායික මාධ්‍ය ඔස්සේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා හෙළි කරනු ඇත. මෙකී නාලිකාවන් ඔස්සේ පාර්ශ්වකරුවන්ට ඔවුන්ගේ ප්‍රතිපෝෂණයන් සහ යෝජනා ඉදිරිපත් කළ හැකි ආකාරය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු සපයනු ඇත.

## පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය සඳහා උපාය මාර්ගය

කණ්ඩායම් සාකච්ඡා, කුඩා වැඩමුළු, යම් යම් අරමුණු කේන්ද්‍ර කරගත් සාකච්ඡා, තෘප්තිමත්භාවය මැන බැලීම සඳහා කරනු ලබන සමීක්ෂණ, සමාජ මාධ්‍ය සහ ප්‍රජා පාලිත නියාමනයන් වැනි බහුවිධ ප්‍රවේශයන් අනුගමනය කරමින්, ව්‍යාපෘති ප්‍රතිලාභීන්/ඉලක්ක ගත කණ්ඩායම්, තෝරා ගැනිමේ නිර්ණායකයන්, ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිඵල, ක්‍රියාත්මක කිරීමේ ක්‍රියා පටිපාටි, බලපෑම් සහ අවදානම්, ආරක්ෂණ පිළියම්, දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණයන් සහ ප්‍රතිලාභී තෘප්තිමත් බව පිළිබඳ අදහස් සහ ප්‍රතිපෝෂණ ලබා ගැනීම සඳහා පාර්ශ්වකරුවන් සමඟ නිරන්තර උපදේශනය, පාර්ශවකරුවන් සහභාගි කර ගැනිමේ සැලැස්ම තුළ හඳුනා ගෙන ඇති පරිදි ව්‍යාපෘති ජීවන චක්‍රය පුරාම සිදු කෙරෙනු ඇත.

## අවදානමට ලක්විය හැකි කණ්ඩායම් සම්බන්ධ කර ගැනීමේ උපාය මාර්ගය

ව්‍යාපෘති කළමනාකරණ කණ්ඩායම් ප්‍රාදේශීය ලේකම් සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල පිහිටුවා තිබෙන වැඩිහිටි ප්‍රතිලාභී අංශය, හඳුනා නොගත් වකුගඩු රෝගී දීමනා අංශය, ආබාධිත දීමනා අංශය වැනි ඒකකවලට අනුයුක්ත කර ඇති නිලධාරීන්ද සමඟ එක්ව බහුවිධ අවදානම්වලින් පීඩිත, වයස්ගත පුද්ගලයින් සිටින , ආබාධිත පුද්ගලයින්, හඳුනා නොගත් වකුගඩු රෝගීන්, පිළිකා රෝගීන්, බෝ නොවන රෝගවලින් පෙලෙන පුද්ගලයින් සිටින පවුල්, සහ අවදානම් සහිත ප්‍රදේශවල සිටින, උදාහරණයක් ලෙස වතුකරය, අඩු පහසුකම් සහිත නාගරික ජනාවාස, දුෂ්කර ග්‍රාමීය ප්‍රදේශ සහ වැදි ප්‍රජාව ජීවත්වන ප්‍රදේශ හා ස්ත්‍රී මූලික කුටුම්භයන් හා තනි ගෘහමූලික කුටුම්භයන් ඇතුළු අනෙකුත් කණ්ඩායම් මෙම ව්‍යාපෘතියට සිය හඬට ඉඩ ලබා දෙන්නා වූ අර්ථවත් ක්‍රියාවලියක් හරහා සහභාගී වීමට හැකි ප්‍රවේශයක් ඇති කරනු ලබන බවට සහතික කරනු ඇත. ප්‍රජා රැස්වීම් පැවැත්වෙන ස්ථානයන් හා වේලාව තිරණය කිරීමේදී උපදේශනයන් සඳහා හඳුනා ගත් ඉලක්කගත කණ්ඩායම් සැලකිල්ලට ගනිමින්, ශාරීරික වශයෙන් අභියෝගකාරි තත්ත්වයෙන් සිටින පුද්ගලයින්ට රැස්වීම්ශාලා වෙත ප්‍රවේශවීමේ හැකියාව, ළමා සුරැකුම් හෝ වැඩිහිටි රැකවරණ සම්බන්ධයෙන් කාන්තාවන් ඉටු කරන යුතුකම් සැලකිල්ලට ගත යුතු අතර රැස්වීම් පවත්වන ස්ථාන කාන්තාවන් සහ ළමුන් සඳහා ආරක්ෂාකාරී ස්ථාන බවටද සහතික කළ යුතු වේ. වැදි ජන ප්‍රජාවන් සම්බන්ධ කර ගැනීමේදි මෙම ප්‍රජාවන් සමඟ කටයුතු කරන ප්‍රජා මූලික සංවිධාන/ප්‍රජා සිවිල් සංවිධාන හරහා හරහා ප්‍රවේශ වීම, දේශීය භාෂාව භාවිතා කිරීම සහ වැදි ප්‍රජාවන්ගේ සමාජ සහ සංස්කෘතික ධර්මතා කෙරෙහි සංවේදී වීම වැනි කරුණු කාරණා සැලකිල්ලට ගනු ලැබේ. මීට අමතරව, වැදි ප්‍රජාවන් සම්බන්ධ කර ගැනීම සඳහා අනුගමනය කරන උපාය මාර්ග දැක්වෙන දේශීය ජනතා ආකෘතියක්ද ලෝක බැංකු පාරිසරික හා සමාජමය ආකෘතියේ අවශ්‍යතාවලට අනුකූලව සකස් කර ඉදිරිපත් කරනු ඇත.

### දුක්ගැනවිලි විසඳුම් යාන්ත්‍රණය

ව්‍යාපෘතිය සඳහා දුක්ගැනවිලි විසඳුම් යාන්ත්‍රණ දෙකක් ඇත. එකක් මුදල් ප්‍රදාන සංරචකය සඳහා සහ අනෙක ජීවනෝපාය උපකාරක සංරචකය සඳහා වේ. සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය යටතේ පිහිටුවනු ලැබූ දුක්ගැනවිලි විසඳුම් යාන්ත්‍රණය තවදුරටත් ශක්තිමත් කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. සුබසාධන ප්‍රතිලාභ මණ්ඩලය පිහිටුවා තිබෙන ඇමතුම් මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය සම්පූර්ණ කරනු ලබන අතර දුක්ගැනවිලි වාර්තා කර වර්ගීකරණය කරනු ඇත. වරින් වර දුක්ගැනවිලි විශ්ලේෂණය කරනු ලැබේ. ගැටළු නිරාකරණයට අවශ්‍ය ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග ගනු ඇත. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලදී, කළමනාකරණ තොරතුරු පද්ධතියට නිලධාරින් තෝරා ගැනීම, බැහැර කිරීම, ඉලක්ක සකස් කිරීම සහ ගෙවීම් යාන්ත්‍රණය ආදියට සම්බන්ධ දුක්ගැනවිලි ලියාපදිංචි කර ලේඛනගත කරනු ඇත. ප්‍රතිචාර දැක්වීම්වලට අදාළ සේවා ප්‍රමිතීන්, දුක්ගැනවිලි යාන්ත්‍රණ අත්පොතෙහි දක්වනු ඇත. ජීවනෝපාය ආධාරක සංරචකය සඳහා වන දුක්ගැනවිලි යාන්ත්‍රණය, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් කළමනාකරණය සහ සම්බන්ධීකරණය කරනු ඇත. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ පාරිසරික හා සමාජ විශේෂඥ වරිය/වරයා ව්‍යාපෘති දුක්ගැනවිලි යාන්ත්‍රණයේ කේන්ද්‍රීය නිලධාරියා ලෙස ක්‍රියා කරනු ඇත. දුක්ගැනවිලි යාන්ත්‍රණය ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්ව ක්‍රියා පිළිබඳ සිදුවීම් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා සුදුසුකම් ලත් සේවා සපයන්නන් වෙත යොමු කිරීම පහසු කරන ආකාරයේ සැලැස්මක් සකස් කරනු ඇත.

### නියාමනය සහ වාර්තා කිරීම

සමාජ ආරක්ෂණ ව්‍යාපෘතිය නියාමනය කිරීම සහ ඇගයීම මුදල් අමාත්‍යාංශයේ සුබසාධන ප්‍රතිලාභ මණ්ඩලය සහ කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව අතර බෙදී යනු ඇත. සුබසාධන ප්‍රතිලාභ මණ්ඩලය සහ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යන ආයතන දෙකම පාර්ශවකරුවන් සම්බන්ධ කර ගැනීමේ සැලැස්ම දියත් කිරීම සඳහා සම්පූර්ණ කාර්ය මණ්ඩලයකින් සමන්විත කරනු ලැබේ. පාර්ශවකරුවන් සමඟ සම්මුඛ සාකච්ඡා, කණ්ඩායම් සාකච්ඡා, ප්‍රතිපෝෂණ සමීක්ෂණ, සහ ක්ෂේත්‍ර චාරිකා ආදී නියාමනය සහ ඇගයීම් සඳහා යොදා ගන්නා බහුවිධ ක්‍රම සහ මෙවලම් ව්‍යාපෘතිය විසින් භාවිතා කරනු ඇත. පාර්ශවකරුවන් සහභාගි කර ගැනීමේ සැලැස්ම ක්‍රියාත්මක කරන ව්‍යාපෘති කණ්ඩායම් දෙකම (සුබසාධන ප්‍රතිලාභ මණ්ඩලය සහ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව) නියාමන සහ ඇගයීම් ප්‍රතිඵල හා බලපෑම් වාර්තාකරණය සඳහා අවශ්‍ය සම්බන්ධිකරණ හා පහසුකරණ කටයුතු සිදු කරනු ඇත. කාල රාමු සහ භාවිතා කළ යුතු මෙවලම්ද ඇතුළුව නියාමන වගකීම් සවිස්තරව දක්වනු ඇත. පුරවැසි සහභාගිත්වය ප්‍රධාන ප්‍රවාහයට අන්තර්ගත කිරීමේ ලෝක බැංකු අවශ්‍යතාවයට අදාළ ප්‍රතිලාභී දර්ශක ප්‍රතිඵල ආකෘතියට ඇතුළත් කර ඇති අතර පාර්ශවකරුවන් සහභාගි කර ගැනීමේ සැලැස්මෙහිද ලේඛනගත කර ඇත.